**ඇල්පිටිය ප්‍රාදේශීය සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

## 01. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 27 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 නොවැම්බර් 23 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයේ පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම් හැර 2011 දෙසැම්බර් 31 දිනට ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදු පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සභාව විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමග හෙළිදරව් කර නොතිබුණි .

#### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.

**(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට විගණන විමසුම් 17 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එකී විමසුම්වලට භාජනය වූ ගනුදෙනුවල ගණනය කළහැකි වටිනාකම රු.9,924,527 ක් විය.

**(ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ඉඩම් හා ගොඩනැගිලි | 22,998,482 | හිමිකම් ඔප්පු, තක්සේරු වාර්තා සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| යන්ත්‍ර හා උපකරණ | 10,837,117 | සමීක්ෂණ මණ්ඩල වාර්තා සහ ස්ථාවර වත්කම් ලේඛනය |
| මෝටර් රථ හා කරත්ත | 4,265,950 | |
| ලී බඩු හා සවිකිරීම් | 1,429,766 | |
| පුස්තකාල පොත් | 1,974,261 | |
| තොග | 879,656 | |
| ආදායම් ණයගැතියෝ | 12,403,718 | කාල විශ්ලේෂණ |
| ආපසු ගෙවිය යුතු තැන්පත් | 2,533,485 | තැන්පත් ලේඛන, උපලේඛන සහ කාල විශ්ලේෂණ |

## 02. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,038,427 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,240,088 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | 2,735 | 3,415 | 4,008 |
| (ii) | බදු කුලී | 1,328 | 2,072 | 423 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,002 | 699 | - |

| | | | | |
|---|---|---|---|---|
| (iv) | වෙනත් ආදායම් | 29,256 | 29,366 | 7,973 |

2.2.2 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 304,250 |
| (ii) | මුද්දර ගාස්තු | 7,669,685 |

2.2.3 **කඩ කාමර බදුදීම.**

---------------------

සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 31 ක් 2003 වර්ෂයේ දී ගිවිසුම් අත්සන් කර බදු දී තිබුණි.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) බදුකරුවන් 17 දෙනෙකුගෙන් 2011 දෙසැම්බර් 31 දිනට අය විය යුතු හිඟ බදු කුලී මුදල රු. 229,555 ක් වූ අතර 2012 මැයි 23 විගණන දිනට රු. 99,670 ක් පමණක් අයකරගෙන තිබුණි.

(ii) දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක:දපපා/පපාකො/2010/1 දරන චක්‍රලේඛය පරිදි සෑම ගිවිසුමක් ම අවුරුදු 3 කට වරක් යාවත්කාලීන කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි .

(iii) චක්‍රලේඛයේ (2) ඡේදය පරිදි කඩ කාමර සඳහා තක්සේරුකරුගෙන් ලබා ගන්නා තක්සේරුව පදනම් කරගෙන සියළුම කඩ කාමර සඳහා කඩ කාමර කුලී මුදල් තීරණය කර නොතිබුණි.

2.2.4 **බැකෝ යන්ත්‍රය කුලියට දීම.**

-------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) බැකෝ යන්ත්‍රය කුලී පදනමට ලබා දීමේ දි ඉදිරිපත් කරනු ලබන ආකෘති පත්‍රයේ, තාක්ෂණ නිලධාරින්ගේ නිර්දේශය අනුව අත්තිකාරම් මුදල ලබා ගත යුතු වුවත්, තාක්ෂණ නිලධාරිගේ ඇස්තමේන්තු නොමැතිව අත්තිකාරම් මුදල් ලබාගෙන බැකෝ යන්ත්‍රය කුලියට ලබා දී තිබූ අවස්ථා නිරීක්ෂණය විය.

(ii) ඉකුත් වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂය තුලදී සභාවේ මන්ත්‍රිවරුන්ට බැකෝ යන්ත්‍රය කුලියට දීම වෙනුවෙන් 2012 මැයි 23 විගණන දිනට රු. 107,270 ක මුදලක් ලැබිය යුතුව තිබුණි.

(iii) බාහිර පාර්ශවයකට 2011 සැප්තැම්බර් 14 දින සිට 22 දින දක්වා මීටර් පැය 48.9 ක කාලයක් සඳහා බැකෝ යන්ත්‍රය කුලියට දීම වෙනුවෙන් ලැබිය යුතු රු. 83,130 කින් රු.51,000 ක් පමණක් අයකර තිබූ අතර, රු.32,130 ක හිඟ මුදල 2012 මැයි මස 23 විගණන දිනය දක්වා ම අය කරගෙන නොතිබුණි.

## 2.3 අවිධිමත් ගනුදෙනු

සමාලෝචිත වර්ෂයේදී එකතුව රු. 216,329 ක් වූ ගෙවීම් වවුචර් 05 ක් සහතික කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණි.

## 2.4 කොන්ත්‍රාත් පරිපාලනය

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

### 2.4.1 ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන වල යටිතල පහසුකම් වැඩි දියුණු කරීම් ව්‍යාපෘතිය.

ඉහත ව්‍යාපෘතිය සඳහා පෞද්ගලික සමාගමක් සමග වටිනාකම රු.29,259,386 ක් වූ ගිවිසුමකට 2010 ජුලි 14 දින එළඹ තිබුණි. 2011 මාර්තු 05 දින වන විට ඉදිකිරීම් නිම කළයුතු විය. ගිවිසුමට අදාල පැකේජය යටතේ වූ මාර්ග හතර සඳහා විගණන දිනය වූ 2012 මැයි 23 දින වන විට රු.15,849,990 ක වියදමක් දරා තිබුණි.

2012 මැයි 21 දින සිදු කරන ලද ස්ථානිය පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

#### (අ) වල්ලඹගල මාර්ගය වැඩි දියුණු කිරීම ( මීටර් 1000 )

රු.1,097,645 ක් වැය කර ඉදිකිරීම් අවසන් කරන ලද මාර්ගයේ කි.මී. 1 ක මුළු දුර ප්‍රමාණයම මාර්ග තලය ගිලා බැසීම් හේතුවෙන් වලවල් සෑදී තිබුණි.

#### (ආ) මහජන මාවත ( මීටර් 840)

ඉදිකිරීම් වෙනුවෙන් රු. 1,198,887 ක් වැය කර තිබුණි. පිරිවිතර අනුව ABC ගල් යොදා මාර්ග තලය මට්ටම් කර MC 30 දියර තාර ආලේප කර (prime) ඉන්පසු පළමු සහ දෙවන වර තාර ආලේප කළ යුතුව තිබුණි. එහෙත් ඇල්පිටිය පිටිගල මාර්ගයෙන් ආරම්භ වන මහජන මාවත ආරම්භයේ සිට මීටර් 606 දක්වා MC 30 දියර තාර ආලේපනය පමණක් කර තබිය දී

මාර්ගය දකුණු පස කාණු ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් කපා ජලනල එලීම කර තිබූ නිසා මාර්ගයට විශාල වශයෙන් හානි සිදු වී තිබුණි. වලවල් හැර් ගල් විසිර් තිබුණි. කි.මී. 606 සිට 840 දක්වා මාර්ග කොටස පමණක් ඉදිකිරීම නිම කර තිබුණි.

ඉංජිනේරුවරයාගේ වැඩ බිම් කාර්යාලය සඳහා ලී බඩු වලට ප්‍රමාණ පත්‍රය අනුව එකඟ වී තිබුණු වටිනාකම රු. 10,000 ක් වුවද 2011 ජුලි 12 දින රු. 33,677 ක් ගෙවා තිබුණි. එහෙත් 2012 මැයි 21 විගණන දින වන විට කොන්ත්‍රාත්කරුගේ සහ ඉංජිනේරු වැඩ බිම් (site engineer) කාර්යාලය වසා දමා තිබුණ ද, අදාල ලී බඩු ආපසු භාර ගෙන නොතිබුණි.

(ඇ) **ඇල්ල - ඌරන්වල - තලාව කේන්ද්‍රගත ප්‍රජා ශාලාව.**

2006 නොවැම්බර් 20 දින රු. 497,890 ක මුදලකට කර්මාන්තය සඳහා සමෘද්ධි සමිතියක් සමග ගිවිසුමට එළඹ තිබුණි . කොන්ත්‍රාත් කාලය මාස 03 ක් විය. 2007 ජනවාරි 24 දින රු.137,992 ක් ගෙවීමෙන් පසු කර්මාන්තය අත්හැර දමා තිබුණි. ඉන්පසු පිළිවෙලින් රු.300,000 ක ඇස්තමේන්තුවක් සහ රු.44,212 ක අතිරේක අරස්තමේන්තුවක් මත 2010 ඔක්තෝබර් 27 හා 2010 දෙසැම්බර් 06 දිනයන් හිදි ඇස්තමේන්තු අගයන් මත වෙනත් සමෘද්ධි සමිතියක් සමග ගිවිසුම් අත්සන් කර තිබුණි. 2010 දෙසැම්බර් 14 දිනැති ගෙවීම් වාර්තා මත 2011 ජනවාරි 06 දින පිළිවෙලින් රු. 256,098 ක් සහ රු. 39,779 ක් සභා අරමුදලින් එකී සමිතියට ද ගෙවා තිබුණි.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉදිකිරීම් කර්මාන්තය ආරම්භ කර වසර 05 කුත් මාස 06 කට අධික කාලයක් ඉක්ම ගොස් තිබු මෙම කර්මාන්තය වෙනුවෙන් රු. 433,869 ක් සභා අරමුදලින් වැය කර තිබුණ ද, ඉදිකිරීම් ප්‍රගතිය 40% ක් පමණක් විය.

(ii) සභාවේ අනුමැතියකින් හෝ අධීක්ෂණයකින් තොරව ඇල්පිටිය ප්‍රාදේශිය ලේකම් විසින් ගොඩනැගිල්ලේ කාමර දෙකක් කපරාරු කර තිබුණි.

## 2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

### 2.5.1 පුස්තකාල පොත්.

ප්‍රධාන කාර්යාලයීය මහජන පුස්තකාලයේ අස්ථානගත වූ පොත් 3075 ක වටිනාකම රු. 267,150 ක් විය. ගොළුවාමුල්ල-ඕමතත උප කාර්යාලයීය පුස්තකාලයේ පොත් 265 ක් ද, අම්බන කහදූව උප කාර්යාලයීය පුස්තකාලයේ පොත් 77 ක් ද, අස්ථානගත වී තිබුණ ද

අලාභය ගණනය කර නොතිබූ අතර ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 156 අනුව කටයුතු කර නොතිබුණි.

කාලය ඉකුත් ව පාඨක නිකුතු පොත් 617 ක් සම්බන්ධව ද නිසි පියවර ගෙන නොතිබුණි.

## 2.5.2 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාර සැලැස්ම.

සංයුක්ත සැලැස්මක් හා වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් සකස් කර නොතිබුණි.
ප්‍රසම්පාදන සැලැස්මක් ද පිළියෙල කර නොතිබුණි.

## 2.6 අභ්‍යන්තර විගණනය

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබූ අතර විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

## 3 පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහ සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය